# පඬුඅබාගේ පීතෘත්වය

පඬුඅබා රජු විසින් සියළු සිංහ වාංශිකයන් මරාදමනු නොලැබූ බව වංශකතාවලින් පැහැදිලි වෙයි. එතුමාගේ රාජ්‍යය යක්ෂ ගෝත්‍රිකයන්ගේ රාජ්‍යයක් නොවූ බව අපට වංශකතාවලින් මෙන් ම සිංහල නම ජාතියට භාවිතාකිරීමෙන් ද පැහැදිලි වෙයි. සිව්හෙළ සිංහල වී ය යන්න හෝ සිංහයන් ලානය කළ බැවින් සිංහල වී ය යන්න හෝ කෘත්‍රිම අර්ථකථන පමණකි. සිව්හෙළ යන්න සිහළ වූ ආකාරය නිරුක්තිවලින් නොසොයා ඉතිහාසයේ සාධකවලින් ම සොයාගත හැකි ද?  ජාතිය සිංහල ලෙස නම්කෙරී ඇත්තේ ම සිංහ වාංශිකයන් නිසා යැයි ගැනීම සාධකවලට එකඟ වෙයි. ජාතිය අවසාන වශයෙන් නම් කෙරෙන්නට ද ඇත්තේ සිංහ වාංශිකයන් නමින් බව පෙනී යයි.

එසේ නම් පඬුඅබා රජු කෙළේ කුමක් ද හා ඔහු කාගේ කවුද යන ප්‍රශ්න පැනනගියි. වංශකතා අනුව ඔහු උන්මාද චිත්‍රාවන්ගේ හා දීඝගාමිණී කුමරුන්ගේ පුත්‍රයා ය. ඒ එසේ නොවේ යැයි පැවසීමට කිසිදු සාධකයක් නැත. විසිවැනි සියවසේ පඬුඅබාගේ පීතෘත්වය චිත්තරාජ නම් යක්ෂ ගෝත්‍රික නායකයාට හිමිකර දීමට කරන ලද උත්සාහය හැරෙන්නට වෙනත් එවැනි තැතක් ලිඛිත ඉතිහාසයෙහි දැකගැනීමට හෝ ජනප්‍රවාදයෙහි දැනගැනීමට  හෝ නැත.

වෙනත් සාධක නැතිව තිබෙන එකම ප්‍රවාදය ප්‍රතික්ෂෙපකිරීම තම හිතුමතයට තමන්ට අවශ්‍ය කරුණක් සනාථ කිරීමට ගන්නා උත්සාහයක් පමණක් වෙයි. අප කළ යුතුවන්නේ තිබෙන ප්‍රවාදය වෙනත් කරුණු සමග කෙතෙක් සංගතවන්නේ දැයි සොයා බැලීම පමණකි. අප සංයුක්ත හෝ වියුක්ත හෝ ප්‍රවාදයක් වෙනුවට වෙනත් ප්‍රවාදයක් ඉදිරිපත්කළ යුත්තේ ඒ වඩාත් සංගත නම් ය. වංශකතාවලට අනුව පඬුඅබා කුමරු ඉපදීමට පෙර පළකළ අනාවැකියකට අනුව එකුමරු විසින් මාමාවරු ඝාතනය වීමට තිබුණි. එබැවින් උන්මාද චිත්‍රාවගේ සොහොයුරන්ට අවශ්‍ය වූයේ ගැබිහත් ඇය මරා දැමීමට ය. එහෙත් පිය රජුගේ හා වැඩිමහල් සොහොයුරාගේ මැදිහත්වීමෙන් ඇයට අභයදානය ලැබුණු අතර කුමරකු ඉපදුණහොත් කුමරා මරාදැමීමට තීරණය විය.

කෙසේ වෙතත් උපත ලත් කුමරා මාමාවරුන්ට නොදැනෙන්නට හද්දකච්චනා මෙහෙසියගේ මෙහෙයවීමෙන් දොරමඬලාවට යවනු ලැබිණි. කුමරා දොරමඬලාවට යැවුණේ ආරක්ෂාව සඳහා මිස වෙනත් කරුණක් නිසා නො වේ. මාමාවරුන්ගෙන් සඟවා කුමරා හදාවඩාගැනීමේ අවශ්‍යතාව පමණක් මෙහෙසියට තිබෙන්නට ඇත. හැරත් ඇය නක්ෂත්‍රකරුවන්ගේ අනාවැකිය විශ්වාස නොකරන්නට ඇත. කුමරා මමාවරු මරාදැමීම යනු හද්දකච්චනා මෙහෙසියගේ පුතුන් මරාදැමීම ය. ඇය ඒ විශ්වාස නොකරන්නට ඇත. ඇය ඒ විශ්වාස කෙළේ නම් පඬුඅබා කුමරාට අනතුරක් නොවී ඔහු හදාවඩාගැනීමට තීරණය කිරීම යනු තම පුතුන්ට මරණය උදා කරලීමට කටයුතු කිරීමකි.

දොරමඬලාව යනු අර්ධ වෛදිකයන්ගේ ගම්මානයක් නොවූ බව ද පැහැදිලි ය. අර්ධ වෛදිකයන් ගම් තනන්නට ඇත්තේ බොහෝ විට ගංගා ඔය ඇළ දොළ ආශ්‍රිත ව බව පැහැදිලි ය. දොරමඬලාව එවැනි ගමක් නො වි ය. තවදුරටත් අධ්‍යයනය කිරීමේ දී මතුවන කරුණක් නම් දොරමඬලාවේ වැවක් ද තිබී ඇති බව ය. පඬුඅබා සැඟවී සිටියේ දොරමඬලාවේ වැවේ තිබූ බෙනයක ය.  වැව් තැනීමට අවශ්‍ය තාක්ෂණය යක්ෂයනට තිබිණි අතර අවශ්‍ය චින්තනය මෙරට විය.

පඬුඅබා කුමරු දොරමඬලාවට යැවීමේ ප්‍රතිඵලය වූයේ ඔහු යක්ෂ ගෝත්‍රික සංස්කෘතියක හැදී වැඩීම ය. ඉපදුණු දින සිට ම යක්ෂ සංස්කෘතියෙහි හැදී වැඩීමත් කුමරු අවට සිංහ වාංශිකයන් නොසිටීමත් හේතුවෙන් පඬුඅබා කුමරුගේ සංස්කෘතිය යක්ෂ විය. මෙය අද දවසේ වුව ද සිදුවන දෙයකි. ඒ කිහිප ආකාරයකින් සිදුවිය හැකි ය. ගම්වල ඉපදෙන දරුවන් කුඩා කාලයෙහි දී ම නගරයේ වසන නෑදෑයකුගේ නිවසක හැදී වැඩීම, ඉතා නාගරික පාසලක හෝ ජාත්‍යන්තර පාසලක ඉගෙනීම ආදී වශයෙන් දැනට සියවසකට පෙර සිට අද දක්වා ම මේ සංස්කෘතික වෙනස්කිරීම සිදු වී ඇත. ඒ සංස්කෘතික වෙනස බ්‍රිතානීන්ගේ අවශ්‍යතාවට පාසල් හා වෙනත් ආයතන ඔස්සේ සිදු කෙරිණි.

දැන් එයටත් වඩා තීව්‍ර ආකාරයකට ඒ වෙනස්වීම සිදුවෙයි. තම දෙමව්පියන් සමග කුඩා කාලයේ දී ම බටහිර රටක පදිංචියට යන දරුවෝ හා ඒ රටවල පදිංචි දෙමව්පියන්ට එහි දී ම ලැබෙන දරුවෝ බටහිර සංස්කෘතියක ම වැඩෙති.

© Prof. Nalin De Silva

ගෙදර සිංහල කතාකළ ද මේ දරුවන් බොහෝමයකට සිංහල නො හැකි ය. එහෙත් ගෙදර සංස්කෘතිය සිංහල නම් මේ දරුවනට යම් සිංහල සංස්කෘතික ආභාසයක් ලැබෙයි. සිංහල කෑම බීම වලට හා සිරිත් විරිත්වලට හුරුවීම පන්සල් යෑම අවුරුදු උත්සව ආදියට සහභාගි වීම ආදිය ඔස්සේ මේ සංස්කෘතික ආභාසය ලැබෙයි.

අද සංස්කෘතික වෙනස වඩාත් ම සිදුවන්නේ බටහිර රටවල වාසය කරන බටහිර අඹු සැමියන් මෙරට දරුවන් දරුකමට හදාගැනීමට ඒ රටවලට ගෙන යෑමෙනි. එසේ ගෙන යන දරුවනට සිංහල සංස්කෘතියෙහි පුළුටක්වත් දැනගැනීමට නො ලැබෙයි. ඔවුන් හැදෙන්නේ වැඩෙන්නේ පූර්ණ බටහිර සංස්කෘතියක ය. එහෙත් වැඩිවයසට පත්වත් ම මේ දරුවෝ තම සිරුරේ පැහැය ආදිය පිළිබඳ විමසිලිමත් වෙති. ඔවුන්ගෙන් සමහරකුට තම ජෛවීය දෙමව්පියන් දැනගැනීමේ වුවමනාවක් ඇතිවෙයි. ඔවුහු ලංකාවට පැමිණ සමහරවිට තම ජෛවීය දෙමව්පියන් සමග සම්බන්ධතා ගොඩනගා ගනිති. එහෙත් ඔවුන්ට ලංකාවෙහි පදිංචි වුවත් සිංහල සංස්කෘතියෙහි ජීවත්විය නො හැකි ය.

භද්දකච්චනා කුමරිය සිංහ වාංශිකයකු සමග විවාහ වුව ද ඇය ශාක්‍ය වාංශික කුමාරිකාවක් වූවා ය. අප කලින් ද සඳහන් කර ඇති පරිදි පඬු අබා කුමරු මාමලාගෙන් බේරාගැනීම සඳහා සුදුසු ම තැන යක්ෂ ගෝත්‍රික ගමක් යැයි ඇය තීරණය කරන්නට ඇත. නාග හා අනෙක් ගෝත්‍ර සිංහ වාංශික අර්ධ වෛදිකයන් සමග සම්බන්ධකම්  මේ වන විට, එනම් අර්ධ වෛදිකයන් මෙරටට පැමිණ අවුරුදු හාරසියයකට පමණ පසුව, ගොඩනගාගෙන තිබෙන්නට ඇත. එහෙත් බොහෝ යක්ෂ ගෝත්‍රිකයෝ එසේ සම්න්ධකම් ඇතිකර නොගත්හ. බොහෝ යක්ෂ ගෝත්‍රිකයන් අර්ධ වෛදිකයන්ට කිසිම පක්ෂපාතිත්වයක් නො දක්වා වාසය කරන්නට ඇතැයි සිතිය හැකි ය.

එයට ප්‍රධාන හේතුවක් වන්නට ඇත්තේ යක්ෂ ගෝත්‍රිකයන්ගේ චින්තනය හා සංස්කෘතිය අර්ධ වෛදිකයන්ගේ චින්තනයට හා සංස්කෘතියට වෙනස්වීම ය. නාග දේව ආදීන්ගේ සංස්කෘතීන් අර්ධ වෛදිකයන්ගේ සංස්කෘතීන් සමග වෙනස්විය හැකි වුවත් චින්තනය වශයෙන් ගත්කල විශාල වෙනසක් නො වී යැයි උපකල්පනය කළ හැකි ය. මෙහි දී අවධාරණය කළ යුතු කරුණු දෙකක් වෙයි. පළමුව එක් චින්තනයක වුව ද විවිධ සංස්කෘතීන් තිබිය හැකි බව ය. සමහරවිට ඒ සංස්කෘතික වෙනස්වීම් ඉතා සුළු ඒවා විය හැකි බව අමතක නොකළ යුතු ය.

දෙවනුව අර්ධ වෛදිකයෝ සිංහ වාංශිකයෝ පමණක් නො වූහ. භද්දකච්චනා කුමරිය ද අර්ධ වෛදික වූවා ය. එහෙත් ඇය ශාක්‍ය වංශයට අයත් වුවා ය. එතරම් අධ්‍යයනයක් කෙරී නැති වුව ද රුහුණට පැමිණ ඇති අර්ධ වෛදිකයන් සිංහ වංශයට අයත් නො වී යැයි කිව හැකි ය. විහාර මහා දේවිය මේ සිංහ වාංශික නොවන අර්ධ වෛදික කුමරියක වීමට ඇති ඉඩකඩ බොහෝ ය. ඇය විසූ කැලණිය රුහුණේ පිහිටි කැලණියක් බව ඇතැම් ඉතිහාසඥයන්ගේ පිළිගැනීම ය. අනුරාධපුරයෙන් ගිය සිංහ වාංශික පරම්පරාවේ කාවන්තිස්ස රජු අර්ධ වෛදික වෙනත් වාංශික කුමාරිකාවක් හා විවාහවීම මෙරට ඉතිහාසය නව මඟක ගමන් කරවීමට සමත් විය.

බොහෝ යක්ෂ ගෝත්‍රිකයන් සිංහ වාංශිකයන් සමග සම්බන්ධකම් ඇතිකර නොගත්ත ද චිත්තරාජ වැනි ඇතැම් යක්ෂ ගෝත්‍රික නායකයන් සිංහ වාංශිකයන් සමග යම් ආකාරයක සම්බන්ධකමක් ගොඩනගාගෙන සිටි බව පැහැදිලි ය. චිත්තරාජ හා කාළවේළ යන නායකයෝ පඬුවස් දෙව් රජුගේ මාළිගාවෙහි සේවය කළහ. ඔවුන් කිනම් අරමුණකින් එසේ සේවයට ගියේ දැයි නිශ්චිතව කිව නො හැකි ය. ඇතැම්විට ඔවුන් යන්නට ඇත්තේ දිගින් දිගට ම සිංහ වාංශිකයන් සමග සම්බන්ධකම් ඇතිකර නොගෙන සිටීම ඵල රහිත ක්‍රියාවක් බව අවබෝධ වූ නිසා විය හැකි ය. එසේත් නැත්නම් මාළිගාවට ම ගොස් සිංහ වාංශිකයන්ට විරුද්ධව යම්කිසි වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවීමට ඔවුන් එහි ගියා විය හැකි ය.

ඒ කුමක් වුවත් ඔවුන් ශාක්‍ය වාංශික දීඝගාමිණී කුමරුගේ සිත දිනාගෙන ඇති බව පැහැදිලි ය. එමෙන් ම භද්දකච්චනා දේවිය ද ඔවුන් විශ්වාස කර ඇත. ඔවුන් ශාක්‍ය වාංශිකයන් සමග සම්බන්ධකම් ඇතිකර ගත්තේ සිංහ වාංශිකයන්ට එරෙහිව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් විය හැකි ය. එසේ ම දීඝගාමිණී කුමරුට චිත්‍රාවන් මුණ ගැසීමට ඔවුන් ආධාර කළා විය හැකි ය. කෙසේ වෙතත් අපට මෙහි දී පැහැදිලි වන කරුණු කිහිපයක් වෙයි. අපට වංශකතාවල එන දීඝගාමිණී කුමරුගේ පීතෘත්වයට පිටින් ගොස් පඬුඅබා කුමරුට වෙනත් පීතෘත්වයක් ලබාදීමේ අවශ්‍යතාව පැන නොනගියි. එලෙස අවශ්‍යතාවක් පැන නගින්නේ ඉතිහාසයෙහි සඳහන් දේ වංශකතාවෙහි දී

© Prof. Nalin De Silva

ඇති පීතෘත්වයෙන් තේරුම් ගැනීමට නොහැකි නම් හෝ වඩාත් සංගත ප්‍රවාදයක් ගොඩනගාගත හැකි නම් හෝ පමණ ය. වංශකතාව අනුව පඬුඅබා පිය පාර්ශ්වයෙන් ශාක්‍ය වාංශිකයෙක් විය. මවු පාර්ශ්වයේ ආච්චි ද ශාක්‍ය වාංශික කුමරියක වුවා ය. මවු පාර්ශ්වයේ සීයා පමණක් සිංහ වාංශික විය. පඬුඅබාට ඉතා සරල අයුරින් කියන්නේ නම් සිදුහත් කුමරුගේ ශාක්‍ය වංශය සමග සියයට හැත්තෑපහක සම්බන්ධයක් විය. අද ඇතැමුන් උත්සාහ කරන්නේ මේ සියයට හැත්තෑපහ විසිපහට බස්සවා යක්‍ෂ සම්බන්ධය සියයට බිංදුවේ සිට පණහට එසවීමට ය.

පඬුඅබා කුමරු දොරමඬලාවට යැවීම දීඝගාමිණී කුමරුගේ ද අනුමැතියෙන් සිදුවන්නට ඇත. සිංහ වාංශිකයන් සමග සම්බන්ධකම් නෙපැවැත්වීයැයි සිතිය හැකි මේ යක්‍ෂ ගෝත්‍රික හම තෝරාගැනීමට චිත්තරාජ හා කාළවේළ යක්‍ෂ ගෝත්‍රික නායකයන් හඳුනාගත්නා දේවියට හා දීඝගාමිණී කුමරුට උපකාරී වීම අවශ්‍ය ය. යක්‍ෂ ගම් ගැන මනා අවබෝධයක් දීඝගාමිණී කුමරුට වඩා ඒ දෙදෙනාට තිබෙන්නට හැකි බව පැහැදිලි ය. පඬුඅබා කුමරු දොරමඬලාවට රැගෙන යැමේ දීත් එහි වැඩෙද්දිත් මේ නායකයන් විශාල කාර්යභාරයක් කර ඇති බව පැහැදිලි ය.

පඬුඅබා යක්‍ෂ ගෝත්‍රික ගම්මානයක සිංහ වාංශිකයන්ගේ හෝ වෙනත් අර්ධ වෛදිකයන්ගේ හෝ ඇසුරක් නොමැතිව හැදී වැඩීම නිසා ඔහුට යක්‍ෂ සංස්කෘතිය හිමි වෙයි. කුමරුට යක්‍ෂ සංස්කෘතියක් ලබාදීමට යක්‍ෂ ගෝත්‍රික පියකු ලබාදිය යුතු නො වේ. මෙරටින් ඉතා බිළිඳු වියේ දී ගෙන ගොස් බටහිර රටවල හැදෙන වැඩෙන දරුවන් බටහිර සංස්කෘතියට හිමිකම් කියන්නේ කෙලෙසක ද, එලෙස ම පඬුඅබා කුමරුට යක්‍ෂ සංස්කෘතිය හිමිවිය. බටහිර හැදෙන වැඩෙන දරුවනට බටහිර සංස්කෘතියක් හිමිවන්නේ ඒ සංස්කෘතියට අයත් දෙමව්පියන් නොමැතිව ය. සංස්කෘතිය යනු ජාන මාර්ගයෙන් හෝ ලේ ධාතුවකින් හෝ අත්කරගන්නක් නො වෙයි. එහි දී වඩාත් ම බලපාන්නේ හැදුණු වැඩුණු සංස්කෘතිය ය. තරුණ පඬුඅබා සංස්කෘතියෙන් යක්‍ෂ විය. ඒ එසේ තිබිය දී පඬුඅබා ජෛවීය වශයෙන් ශාක්‍ය වංශයෙන් ඉවත්කිරීමේ අවශ්‍යතාව අද තිබිය හැක්කේ කා හට ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva